# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,480 - 2026 මාර්තු මස 13 සිකුරාදා - 2026.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 344 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 02 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 20 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඬිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


343 - B 082773— - (2026/03)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ, පළාත් ආදායම් සේවයේ 3 වන පන්තියේ II වන ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු 02ක් සම්පූර්ණ කිරීම සඳහා **2026.04.02** දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් ම මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2026.04.02 වේ.**

**01. සුදුසුකම් -**

**1.1. පොදු සුදුසුකම්**

1.1.1. අයදුම්කරු/ අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

1.1.2. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03 කට නොඅඩු කාලයක් මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

1.1.4. සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

1.1.5. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි අයකු විය යුතුය. (ඒ අනුව 2008.04.02 දිනට හෝ ඊට පෙර හා 1991.04.02 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. දැනටමත් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරේ ස්ථිර කර ඇති නිලධාරින්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.)

1.1.6. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිඳු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

1.1.7. සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**1.2 අධ්‍යාපන සුදුසුකම් -**

1.2.1. ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරින් හෝ නීතිඥයින් ;

*හෝ*

1.2.2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අන්තර් මාධ්‍ය පරීක්ෂණ සහතිකය ;

*හෝ*

1.2.3. රජයේ උසස් තාක්ෂණායතනයක ගණකාධිකරණය, වාණිජ විද්‍යාව හෝ කළමනාකරණය පිළිබඳ මධ්‍ය පරීක්ෂණය සමත් වීම ;

*හෝ*

1.2.4. වරලත් ගණකාධිකාරීන්ගේ කළමනාකරණ ආයතනයේ (CIMA - එක්සත් රාජධානිය) I, II හා III යන කොටස් සමත් වීම හෝ ඊට සමාන යම් පරීක්ෂණයක් සමත් වීම ;

*හෝ*

1.2.5. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පළාත් රාජ්‍ය සේවයේ, සේවය කරමින් සිටින එදින වන විට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සහිත මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ලිපිකරු හා සමාන්තර සේවාවන්ට (මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය) අයත් නිලධාරියකු විය යුතුය.)

(මෙම නිලධාරින්ට ද ඉහත 1.1.5 හි සඳහන් වයස් සීමාව අදාළ නොවේ)

**02. වැටුප් පරිමාණය -**

2.1. 2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන II හි MN 5 – 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර, එයට අදාළ වැටුප් පරිමාණය; රු. 58,660 – 10×1190-11×1,360-15×1,670 - රු.110,570/-

2.2. එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ.

2.3. පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03. සේවා කොන්දේසි -**

3.1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්ති තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ.

3.2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත්කරනු ඇත.

3.3. මෙම තනතුරේ ස්ථිර කිරීම සඳහා මධ්‍යම පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාවේ උපලේඛනයේ පරිශිෂ්ටය (අ) (2) හි සඳහන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතු අතර සමත්වූ නිලධාරින් පරිවාස කාලය අවසානයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

3.4. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලටද, රජය හා/හෝ පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

3.5. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2008.07.02 දිනෙන් අනුමත කර ඇති මධ්‍යම පළාත් සභා ආදායම් දෙපාර්තමේන්තුවේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීමේ කාර්යය පරිපාටියෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පරිපාටියෙහි සඳහන් කර ඇති හා මින්මතු සිදුකෙරෙන සංශෝධනයන් සඳහා යටත් වනු ඇත.

**04. බඳවා ගැනීමේ ක්‍රමය -**

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 100% ම විවෘත බඳවා ගැනීම යටතේ සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ 3 වන පන්තියේ II වන ශ්‍රේණියේ බඳු නිලධාරි තනතුරට පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

**05. බඳවා ගැනීමේ විභාගය -**

**5.1. විභාග මාධ්‍යය**

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අංකය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**5.2.** විභාග මධ්‍යස්ථානය

- විභාගය **මහනුවර දී පමණක්** පවත්වනු ලැබේ.
- විභාග මධ්‍යස්ථානය අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

**5.3.** විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම

- විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.
- අපේක්ෂකයකුහට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.
- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන (www.psc.cp.gov.lk) හි පළකරනු ලැබේ. ප්‍රවේශ පත්‍ර විභාගය පැවැත්වීමට දින 14කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ අයදුම්කරු විසින් අයදුම්පතෙහි දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑල මඟින් හෝ යොමු කරනු ලැබේ.
- නිවේදනය පළවී දින 04ක් 05ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී ඔබගේ අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විභාග අංශය වෙතින් විමසීම් කළ යුතුය.
  (දුරකථන අංකය 081 – 2213097 )

**5.4.** විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :

මෙම විභාගයේ ප්‍රතිඵල ලේඛනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකරනු ලැබේ.

**6.** **අපේක්ෂකයාගේ අනන්‍යතාවය**

**6.1.** ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිඳු අයදුම්කරුවකුට විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තමා පෙනී සිටින විභාගය සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛන පමණක් වලංගු වනු ඇත.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

**6.2.** විභාග අපේක්ෂකයන් සිය අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණ කිරීමෙන් තොරව විභාගයට පෙනී සිටිය යුතු අතර, විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බවට සනාථ කරන අයදුම්කරුවන් පමණක් විභාග ශාලාවට ඇතුළත් කර ගනු ලැබේ. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන්වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**7. විභාගයේ විෂය නිර්දේශය -**

- සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය සඳහා වූ එක් ප්‍රශ්න පත්‍රයකි.
  (කාලය පැය 01 ½ යි. ලකුණු 100 යි.)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය. එක් කොටසකට ලකුණු 50 කි. පළමුවන කොටස වන බුද්ධි පරීක්ෂණයට පළමුවන මිනිත්තු 45 ඇතුළත පිළිතුරු සපයා භාර දිය යුතුය. අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා වූ දෙවන කොටසට ඉතිරි මිනිත්තු 45 කාලය තුළදී පිළිතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය විෂයය සාමාර්ථ්‍යය සඳහා ලකුණු 40% කට නො අඩුව ලබා ගත යුතුය.

**8. අයදුම්පත් පිරවීමට උපදෙස් -**

ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාර A4 ප්‍රමාණයේ (සෙ.මී.21x25) කඩදාසියක දෙපසම භාවිත කරමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවට ද, 04 සිට 09 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව නිරීක්ෂණය වන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**8.1.** අයදුම්කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

**8.2.** අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 10/2025 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතිය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ මධ්‍යම රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**8.3.** යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

**8.4.** රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් දරන නිලධාරියකු අයදුම්කරුවකු වන්නේ නම් ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය තමා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**9. අයදුම් කිරීමේ ක්‍රමය -**

**9.1.** විභාග ගාස්තුව රු.600/-කි.

**9.2.** අයදුම්කරුවන් තම විභාග ගාස්තු ගෙවීමේදී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

- සෑම අපේක්ෂකයකුම රු 600.00 ක විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා, ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

- වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව යොමු කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**9.3.** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2026.04.02** දිනට **පෙර ලැබෙන සේ "ලේකම් , රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක. 244, කටුගස්තොට පාර, මහනුවර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බඳු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

**10.** **සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම්:-**

**10.1.** මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනීයන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

**10.2.** අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතා මතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් සළකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුව ද යටත්වේ.

**11.** මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පත්කරනු ලබන සංඛ්‍යාව/ පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

**12.** මෙම බඳවා ගැනීමට අදාල නිවේදනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකරනු ලබන අතර, ආදර්ශ අයදුම්පත්‍රයද එමඟින් බාගත කරගැනීමට හැකියාව ඇත.

**13.** මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2026 පෙබරවාරි මස 27 වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මධ්‍යම පළාත් සහ රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ III වන පන්තියේ II වන ශ්‍රේණියේ බදු නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026*

විභාග අංකය :- [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ]

(සිංහල - 2 , දෙමළ - 3, ඉංග්‍රීසි - 4)
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

පදිංචි දිස්ත්‍රික්කය :- [ ]

දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය :- [ ]

1.0 1.1 මුලකුරු සමඟ නම :.......................................................................

Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- SILVA A.B.C.D.)

1.2 මුලකුරු සමඟ නම :-.......................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-.......................................................................
.......................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :-.......................................................................
.......................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :-.......................................................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :-.......................................................................
.......................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- .......................................................................
.......................................................................

2.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් කාර්යාලයීය ලිපිනය :- .......................................................................
.......................................................................

2.5 ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.6 ස්ත්‍රී/පුරුෂ භාවය :- 0 - පුරුෂ , 1- ස්ත්‍රී [ ]

03. 3.1 උපන් දිනය :-

| Y | Y | Y | Y | M | M | D | D |
|---|---|---|---|---|---|---|---|

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස :- අවු : ................., මාස : ..................., දින : ..................

3.3 ජංගම දුරකථන අංකය :- | | | | | | | | | | |

04. විවාහක/අවිවාහක බව :- [ ]

අවිවාහක - 1 විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :-.......................................................

| *ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2023* | *2024* | *2025* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. අධ්‍යාපන සුදුසුකම්:-

06.1

| *විශ්වවිද්‍යාලයේ හෝ ආයතනයේ නම* | *ලබා ඇති උපාධිය හෝ සමත් විභාගය* | *උපාධියට හෝ විභාගයට හදාරා ඇති විෂයයන්* | *ලැබූ පන්ති සාමර්ථ්‍ය* | *සහතිකපත් අංකය හා උපාධිය හෝ විභාගය වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |

06.2 සාමාර්ථ්‍ය ලබා ඇති ඉහළම විභාග :

(අ) සිංහලෙන්/දෙමළෙන් :- ..........................................
(ආ) ඉංග්‍රීසියෙන් :- ...................................................

07. අයදුම්කරු විසින් කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (අදාළ වේ නම්) :-

| *දෙපාර්තමේන්තුව/ ආයතනය* | *දැරූ තනතුර* | *කාලය* | | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|---|
| | | *සිට* | *දක්වා* | |
| | | | | |

08. විභාග ගාස්තු රු. 600/- ගෙවීම පිළිබඳ තොරතුරු :

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :-..................................
(ii) දිනය :- .............................................................................
(iii) කුවිතාන්සි අංකය :- .........................................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.<br>( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ) |

09. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද? :.........................................................................................

එසේ නම් විස්තර දක්වන්න. :- ..................................................................................................................

**අයදුම්කරුගේ ප්‍රකාශය**

10. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ............................... | ............................................., |
| දිනය | අයදුම්කරුගේ අත්සන. |

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

| | |
|---|---|
| දිනය:- ............................... | ............................................, |
| | සහතික කරන්නාගේ අත්සන. |

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :- ..........................................................................
තනතුර :- ..........................................................................
ලිපිනය :- ..........................................................................

12. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.

ඉහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇති ......................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ...........................................................................වශයෙන් සේවය කරයි. මෙම නිලධාරියාගේ/නිලධාරිණියගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කළ අතර,

1. නිලධාරියා සම්බන්ධව මේ වනවිට විනය හෝ විගණන කටයුත්තක් ආරම්භ කිරීමට කටයුතු කරමින්/ විනය හෝ විගණන පරීක්ෂණයන් සිදු වෙමින් පවතී/නොපවතී :.......................................................................................................

   1.1. ඉහත පිළිතුර පවතී නම් එහි වර්තමාන තත්වය :...................................................................................

2. ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

3. නිලධාරියා/නිලධාරිණිය තෝරා ගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

4. නිලධාරියාගේ /නිලධාරිණියගේ අයදුම්පත්‍රය නිර්දේශ කරමි/ නොකරමි.

......................................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :- .....................................

03-122

---

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වයඹ පළාතේ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| *සංකේත අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගන්නා පදනම* | *පුරප්පාඩු* |
|---|---|---|---|
| 01. | කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය | ස්ථිර පදනමින් | 18 |
| 02. | කාර්මික නිලධාරී (සිවිල්) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය | එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය | |
| 03 | කාර්මික නිලධාරී (සිවිල්) දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය | දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය | |

** - ඉහත සංකේත අංක 01 සඳහා සුදුසුකම්ලත් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක අංක 02 සඳහා ද අංක 01 හා 02 යන තනතුරු දෙකම සඳහා සුදුසකම්ලත් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක අංක 03 සඳහා ද අවස්ථාව හිමි වේ.

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2026 අප්‍රේල් මාසයේ දී** කුරුණෑගල නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

**01. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-**

ඉහත සඳහන් සියළු තනතුරු සඳහා,

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් සහිතව ගණිතය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම ;

*හෝ*

තාක්ෂණවේදය විෂයය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් (03) අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම ;

*සහ*

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සැ.යු.* - ඉහත අධ්‍යාපන සුදුසුකම් සමඟ එක් එක් තනතුර සඳහා පහත වෘත්තීය සුදුසුකම් ද සම්පූර්ණ කර තිබිය යුතුය.

**(ආ) වෘත්තීය සුදුසුකම් :-**

| *තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම* |
|---|---|
| කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය | I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය මඟින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මඟින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;<br>*හෝ*<br>VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;<br>*හෝ*<br>VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| කාර්මික නිලධාරී (සිවිල්) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය | I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම ;<br>හෝ<br>II. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| කාර්මික නිලධාරී (සිවිල්) දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය | **වෘත්තීය සුදුසුකම් අදාළ නොවේ.** |

**සැ.යු. :- ඉහත සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් 2026.03.31 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුයි.**

**02. වෙනත් සුදුසුකම් :-**

2.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

2.2 සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි විය යුතුය.

2.3 අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට වයඹ පළාත තුළ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරී සහතිකය) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය. **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩු අයදුම්කරුවන් ද තමන් පදිංචි කාල සීමාව DS 04 ග්‍රාම නිලධාරී සහතිකය මඟින් තහවුරු කළ යුතුය.**

2.4 අයදුම්කරු වයඹ පළාතේ ස්ථිර පදිංචිය ලබා තිබුණ ද අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩුවන අවස්ථාවල දී, අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට අයදුම්කරුගේ කලත්‍රයා හට වයඹ පළාතේ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිය තිබේ නම්, එම අයදුම්කරුවන් පිළිබඳව ද ඉහත 2.3 වගන්තිය ප්‍රකාරව සලකා බැලේ. **කලත්‍රයාගේ සහ අයදුම්කරුගේ පදිංචි සහතික හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.**

2.5 අදාළ තනතුර සඳහා බඳවාගනු ලැබුවහොත් අවම වශයෙන් වසර 10 ක් වයඹ පළාත තුළ සේවය කළ යුතු වේ.

2.6 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

2.7 තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**සංලක්ෂය :-**

**යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.**

**03. වැටුප් පරිමාණය:-**

**3.1 <u>කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය</u>**

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2025.01.01 දිනැති අංක. 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 – 2025 අනුව,

රු. 52,250 - 10x 800 - 11 x 1,190 - 10 x 1,320 - 10 x 1,350 - රු.100,040/- වේ.

(2027.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

3.2 <u>කාර්මික නිලධාරි එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය/කාර්මික නිලධාරි දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය</u>

රා.ප.ච. 10/2025 හි උපලේඛන අංක. VI අනුව පුහුණු කිරීමේ ශ්‍රේණියට අදාළව මාසික දීමනාව රු.41,317.00 කින් ආරම්භ වී ඉදිරියට ගෙවීම් කරනු ලබන අතර පුහුණු කාලය අවසානයේ III වන ශ්‍රේණියට පත්වීම් ලද පසු ඉහත 3.1 හි දක්වා ඇති MN 3 – 2025 ට අදාළ වැටුප් පරිමාණය අනුව වැටුප් ගෙවනු ලැබේ.

**04. සේවා කොන්දේසි:-**

4.1 මෙම තනතුර ස්ථිරය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

4.4 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීනතාවය නියමිත මට්ටමට ලබා ගත යුතුය.

4.5 III වන ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීනතාවයක් ලබා ගත යුතුය.

4.6 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්ය සංග්‍රහයට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් සභා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට ද රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරින් බැඳී සිටී.

05. දෑ අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරින් සඳහා විශේෂ කොන්දේසි:-

5.1 විවෘත ධාරාවෙන් පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරින් සේවයේ ස්ථිර කිරීම සඳහා අනෙකුත් කොන්දේසි වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කළ යුතුයි.

(අ) පුහුණු කිරීමේ ශ්‍රේණියට පත් වී අවුරුදු 04 ක් තුළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරකට අදාළ ක්ෂේත්‍රයක සති අන්ත අවුරුදු 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණික සහතිකය ලබා ගැනීම. (උදා. ජාතික තාක්ෂණික සහතිකය - සිවිල්)

*හෝ*

(ආ) පුහුණු ශ්‍රේණි සඳහා බඳවා ගනු ලබන නිලධාරින් වයඹ පළාත් සභාව විසින් පිළිගනු ලබන ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ නේවාසික පුහුණු පාඨමාලාවක් සාර්ථකව හදාරා **NVQ 5** සහතිකය ලබා ගැනීම.(මෙම නේවාසික පුහුණු පාඨමාලාව හැදෑරීමට පෙර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා සමග ගිවිසුම්ගත විය යුතුය)

**06. බඳවා ගැනීමේ ක්‍රමය:-**

6.1 ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. විභාග විෂයය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ප්‍රමුඛතා ලේඛනයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වූ විට එම අය ලිඛිත විභාගයකින් තොරව සම්මුඛ පරීක්ෂණයකින් පමණක් බඳවා ගනු ලැබේ.

6.2 සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

6.3 III ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටින විට III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

6.4 III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක ඉතිරි පුරප්පාඩු සඳහා එක් අවුරුදු පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. එසේ බඳවා ගන්නා ලද අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

6.5 එක් අවුරුදු පුහුණු ශ්‍රේණියටද බඳවා ගැනීමෙන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු පවතී නම් දෑ අවුරුදු පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. එසේ බඳවා ගන්නා ලද අයදුම්කරුවන් දෙවසරක පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

*සටහන* **:- ඉහත පුහුණු කාල සීමාව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගයෙන් අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.**

**07. ලිඛිත විභාගය :-**

7.1 ලිඛිත විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂය නිර්දේශයන් පහතින් දක්වා ඇත.

7.3 දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේදී විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය අදාළ නොවේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

**විෂයය නිර්දේශය :-**

**01. බුද්ධි පරීක්ෂණය**

අයදුම්කරුවන්ගේ භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ශෛලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ.

**02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය**

**කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය, කාර්මික නිලධාරි (සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය**

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ජල සම්පාදනය හා ජලවහනය, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිබඳව අපේක්ෂකයා සතු සහජ හැකියාව විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.

08. **විභාග ගාස්තු :-**

